centre for poverty analysis

ප්‍රතිපත්ති සංක්ෂිප්තයක්

# යුද මායිමේ සිට:
# පලන්කුඩ් ප්‍රජාවේ පශ්චාත් යුධ අත්දැකීම්



දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය
ජූලි 2022

# විධායක සාරාංශය

Memories from the Margin: The Voices of coastal Indigenous Communities නම් වූ මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සැලසුම් කර ඇත්තේ පශ්චාත් යුද සංහිඳියාව පිළිබඳ සංවාදයට ආන්තිකකරණයට (marginalised) ලක් වූ හඬවල් ඇතුළත් කර එම සංවාදය පුළුල් කොට එමගින් සාමය පිළිබඳ අන්තර් ඡේදනයක් (intersectional) සහිත අවබෝධයකට දායක වීමය. මෙම ව්‍යාපෘතිය දරිද්‍රතා විශ්ලේෂණ මධ්‍යස්ථානය (CEPA) විසින් මෙහෙයවන ලද අතර දකුණු කැරොලයිනා විශ්ව විද්‍යාලයේ (University of South Carolina) Rule of Law Collaborative හි Think Tank Capacity Building (TTCB) වැඩසටහන මඟින් අරමුදල් සපයන ලදී. පශ්චාත් යුධ සංහිඳියාවේ කේන්ද්‍රස්ථානය වෙත ආන්තිකකරණයට ලක් වූ හඬවල් ගෙන ඒම සහතික කිරීම සඳහා, පර්යේෂණ ව්‍යාපෘතිය ත්‍රිකුණාමලයේ (සන්තෝසපුරම් සහ වෙරුගල් හි) පලන්කුඩි (ආදිවාසී) ප්‍රජාවන් දෙකක් සමඟ වැඩ කරමින් ඔවුන්ගේ ඉතිහාසය, සම්ප්‍රදායන්, සංස්කෘතිය, සහ සිවිල් යුද්ධය සහ පශ්චාත් යුධ සමයේ ඔවුන්ගේ ජීවිත කෙරෙහි අවධානය යොමු කළේය.

ඔවුන්ගේ ආඛ්‍යාන/වෘතාන්ත ඉතිහාසය (narrative history) මධ්‍යයට ගෙන ඒමේ දී, මෙම පර්යේෂණ ව්‍යාපෘතිය සහභාගීත්ව පර්යේෂණ (Participatory Research) ක්‍රමවේදයක් අනුගමනය කළේය; මෙම ක්‍රමවේදය අනුගමනය කිරීමෙන්, පර්යේෂණ කණ්ඩායම එම ප්‍රජාව විසින්ම නිර්මාණය කරන ලද ආඛ්‍යානය ඉදිරිපත් කිරීම සහතික වේ. පර්යේෂණ ව්‍යාපෘතියේ සමස්ත අරමුණ ලෙස පලන්කුඩි ප්‍රජාවන්ට අදාළ ප්‍රතිපත්ති නිර්දේශ කිරීමය; තවද, ප්‍රජාව සහ ඔවුන්ගේ ගැටලු ඉස්මතු කරන සමාජ මාධ්‍ය ව්‍යාපාරයක් සහ ඡායාරූප ප්‍රදර්ශනයක් මෙම ව්‍යාපෘතියට ඇතුළත් වුන නමුදු, මෙම ලේඛනයේ අඩංගු කලින් සඳහන් කරන ලද ප්‍රතිපත්ති නිර්දේශ පමණි.

ප්‍රජාව සමඟ සම්මුඛ සාකච්ඡා අතරතුර ද තරුණයින් සමඟ ඡායාරූප ගැනීමේ ක්‍රියාවලිය අතරතුර ද මෙම ප්‍රජාව දැනට මුහුණ දෙන ගැටලු (විශාල වශයෙන් ව්‍යුහාත්මක හා ආයතනමය) කිහිපයක් අනාවරණය වූ අතර, මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය කෙටුම්පත් කර ඇත්තේ එම ගැටළු විසඳීමේ අරමුණින් ය.

පලන්කුඩි ජනතාව වසර ගණනාවක් තිස්සේ දමිළ ජනයා සමඟ ජීවත් ව සිටි බැවින්, ඔවුන් අනුගතවීමේ සහ කරවීමේ බලවේග (forces of assimilation) සමඟ පොරබදමින් සිටිති (ස්වේච්ඡාවෙන් සහ බලහත්කාරයෙන්); මෙය ඔවුන්ගේ භාෂාව සහ සංස්කෘතිය ද පලන්කුඩි ලෙස ස්වයං හඳුනාගැනීම (self-identification) අතුරුදහන් වීමට හේතු වී ඇත. අනන්‍යතාවය නැතිවීම තවදුරටත් ව්‍යුහාත්මකව සහ ආයතනමය ලෙස තීව්‍ර කර ඇත්තේ හඳුනාගැනීමේ ලියකියවිලි වල පලන්කුඩි ජනයා ශ්‍රී ලාංකික දමිළ ලෙස හඳුනා ගැනීමයි. ආදිවාසී ප්‍රජාවන්ට වැදගත් වන සමාජ-සංස්කෘතික අයිතීන් අහිමි කරවීමට අනුගතවීමේ සහ කරවීමේ බලවේග හේතු වී ඇත.

සන්තෝසපුරම් හි පලන්කුඩි ප්‍රජාවට මූලික සේවාවන් සැපයීමේ අඩුවක් ද දක්නට ලැබේ; පිරිසිදු පානීය ජල පහසුකම් නැති වීම, ප්‍රවාහන සේවා, ගුණාත්මක අධ්‍යාපන පහසුකම් නැති වීම, ජීවනෝපායන් අහිමි වීම, සහ ආහාර අනාරක්ෂිත භාවය යනාදිය මෙයට ඇතුළත් වේ. පිරිසිදු ජල පහසුකම් නොමැති වීමෙන් සන්තෝසපුරම් ප්‍රජාව තවත් සංකීර්ණ වූ ගැටළු වලට මුහුණ දෙමින් සිටිති. මෙය සනීපාරක්ෂාවට ඇති ඉඩකඩ අඩු කරමින්, ඔවුන් අපිරිසිදු ජන කොටසක් ලෙස අනෙකුත් ප්‍රජාවන් හට පෙනීමට හේතු වී ඇත. ඔවුන්ගේ පාරම්පරික ජීවනෝපායන්හි නියැලීමට ඇති ආයතනමය බාධාවන් නිසා මූල්‍ය අනාරක්ෂිත භාවය සහ කෘෂිකර්මාන්තයේ යෙදෙන විට කෘෂි රසායන මත යැපීමට ද මොවුනට සිදුවී ඇත; මෙය කෙමෙන් කෙමෙන් මෙම ප්‍රජාව සහ ඔවුන්ගේ පශු සම්පත් ආහාර අනාරක්ෂිතතාවය කෙරෙහි තල්ලු කර ඇත.

මෙම පර්යේෂණයේ සොයාගැනීම්වලින් අනාවරණය වූයේ, විවිධ හේතුන් නිසා පලන්කුඩි ජනයා බොහොමයක් වූ අභ්‍යන්තර අවතැන්වීම් (internal displacement) රැල්ලන් හට ගොදුරු වී ඇති බවයි. තම නිදහස (agency) සහ බලය නොමැතිකම රජයට ද (තවද හමුදාවට ද), අනෙකුත් ප්‍රජාවන් සහ බලගතු පුද්ගලයින්ට ද පලන්කුඩි ජනයාගේ පාරම්පරික නිජබිමෙන් ඔවුන්ව ඉවත් කිරීමට අවකාශය නිර්මාණය කර ඇති අතර එය ඉඩම් කොල්ලයට ද තුඩු දී ඇත. සාම්පූර්හි යෝජිත තාප බලාගාරය හේතුවෙන් සන්තෝසපුරම්හි පලන්කුඩි ප්‍රජාවේ පවුල් රැසකට තම නිවෙස්වලට මෙන්ම තම ප්‍රජාවට සහ අනන්‍යතාවයට සංස්කෘතික හා ඓතිහාසික වැදගත්කමක් ඇති අනෙකුත් ස්ථානවලට ද ප්‍රවේශය අහිමි වී ඇත. පශ්චාත් යුධ සමය තුළ ඇති වූ හමුදාකරණය සහ එහි ප්‍රතිඵලයක් වූ බෞද්ධකරණය (Buddhisation) හේතුවෙන් මෙම ප්‍රජාවන්ට තම පාරම්පරික නිජබිම් අහිමි වීම හැරුණු විට ඔවුන්ගේ ආගමික සිද්ධස්ථාන අහිමි වීමක් ද දක්නට ඇත.

මෙම ලේඛනය හරහා ඉදිරිපත් කර ඇති ප්‍රතිපත්ති නිර්දේශයන්, පලන්කුඩි ප්‍රජාව මුහුණ දෙන ගැටලුවල බහුවිධතාව (multiplicity) සහ අන්තර් ඡේදනය සැලකිල්ලට ගනී; මෙහි අරමුණ වන්නේ, මෙම ප්‍රජාවන් අනන්‍යතාවය සහ පශ්චාත් යුධ සංහිඳියාව පිළිබඳ කතිකාවන් වල (discourses) කේන්ද්‍රය වෙත ගෙන ඒමයි.

# පටුන


1. හැඳින්වීම 03
2. ප්‍රවේශය/ක්‍රමවේදය 04
    2.1. ප්‍රජා නායකයින් සමඟ පැවති සම්මුඛ සාකච්ඡා 04
    2.2. සහභාගීත්ව පර්යේෂණය 04
3. පලන්කුඩි ජනයාගේ ආඛ්‍යාන/වෘතාන්ත ඉතිහාසය 05
4. ප්‍රතිඵල/ප්‍රධාන ගැටළු 07
    4.1. සංස්කෘතියේ මායිම්: අනන්‍යතාවය, ඉතිහාසය සහ සංස්කෘතිය අනුගත වීම/කරවීම සහ මකා දැමීම 07
    4.2. දරිද්‍රතාවයේ මායිම් 08
        4.2.1. මූලික සේවාවන්ට ඇති අඩු පහසුකම් 08
        4.2.2. ගුණාත්මක අධ්‍යාපනයකට පහසුකම් අඩු වීම 08
        4.2.3. ජීවනෝපායන් අහිමි වීම සහ ආහාර සුරක්ෂිතතාවය නොමැති වීම 09
    4.3. යුද්ධයේ මායිම් 09
        4.3.1. බලහත්කාරයෙන් ඉවත් කිරීම සහ අභ්‍යන්තර අවතැන්වීම 09
        4.3.2. ඉඩම් කොල්ලය 10
        4.3.3. බලහත්කාරයෙන් බඳවා ගැනීම් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම් 10
        4.3.4. මිලිටරිකරණය සහ බෞද්ධකරණය 10
5. නිගමනයන් 11
6. ප්‍රතිපත්ති නිර්දේශ 12

# 1. හැඳින්වීම

මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය (CEPA) විසින් පැවැත්වූ 'Memories from the Margin' පර්යේෂණ ව්‍යාපෘතියේ කොටසක් ලෙස සකස් කර ඇති අතර දකුණු කැරොලයිනා විශ්ව විද්‍යාලයේ (University of South Carolina) Rule of Law Collaborative හි Think Tank Capacity Building (TTCB) විසින් සපයන ලද අරමුදල් මඟින් සම්පූර්ණ කොට ඇත. මෙම ව්‍යාපෘතිය ත්‍රිකුණාමලයේ වෙසෙන වෙරළබඩ ආදිවාසී (පලන්කුඩි) ප්‍රජාවගේ යුද සමයේ අත්දැකීම් සහ පශ්චාත් යුද සන්දර්භය අධ්‍යයනය කර ලේඛනගත කරන ලදී. සමස්තයක් ලෙස, මෙම ව්‍යාපෘතිය අවධානය යොමු කළේ ඔවුන්ගේ අවතැන්වීම්, නැවත පදිංචි කිරීමේ අත්දැකීම් සහ ඔවුන්ගේ සංස්කෘතිය, සම්ප්‍රදායන්, සහ ඉතිහාසය කෙරෙහි ය. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ශ්‍රී ලංකාව පිළිබඳ පශ්චාත් යුද ආඛ්‍යානය තුළ ආන්තික ප්‍රජාවන්ගේ හඬ ඇතුළත් කිරීමයි.

පශ්චාත් යුධ ශ්‍රී ලංකාවේ ආඛ්‍යාන ඉතිහාසය අත්පත් කරගන්නේ සිංහල සහ දමිළ ප්‍රජාවන්ගේ පර්යාලොකයන් මගිනි. කෙසේ වෙතත්, සාමය පිළිබඳ අන්තර් ඡේදනයක් සහිත අවබෝධයක් සඳහා යුද්ධයෙන් බලපෑමට ලක් වූ අනෙකුත් ආන්තික කණ්ඩායම්වල හඬ ද ඇතුළත් කිරීම් සාමය සහ සංහිඳියාව පිළිබඳ අවබෝධය පුළුල් කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. අන්තර් ඡේදනයෙන් අර්ථකථනය වන්නේ "අනන්‍යතාවය, සමාජ-ආර්ථික තත්ත්වය, සහ අප අවට ලෝකයට අපව ගලපවන බල පද්ධති අතර බද්ධ වූ සම්බන්ධතාවල සංකීර්ණත්වය"[1] යි. සාමයෙහි සන්දර්භය තුළ, මෙයින් ඇඟවෙන්නේ, මෙම තරඟකාරී අනන්‍යතා සහ සූක්ෂ්මතා සලකා බලමින් සාමය සඳහා වඩාත් සාකල්‍ය සහ තිරසාර ප්‍රවේශයක් සක්‍රීය කිරීමය.[2] ප්‍රචණ්ඩ ගැටුම්වල චක්‍රීය ස්වභාවයට සෘජුවම ආරෝපණය කරන ලද නව අභියෝග සහ ආගමික ආතතීන් හමුවේ ශ්‍රී ලංකාව සිය පශ්චාත් යුධ කාලරාමුවේ තීරණාත්මක ස්ථානයක සිටී. මෙම සන්දර්භය තුළ, වඩාත් තිරසාර සහ 'ධනාත්මක සාමයක්'[3] සඳහා පහසුකම් සැලසීම සඳහා විවිධ පාර්ශවකරුවන්ගේ යුධ සමයේ අඛ්‍යානයන්, විශේෂයෙන්ම ආන්තිකකරණයට ලක් වූවන්ගේ හඬ, අන්තර් ඡේදනය සහිත වූ සාමය සහ සංහිඳියාව පිළිබඳ කතිකාවකට අත්‍යවශ්‍ය වේ. පලන්කුඩි ප්‍රජාව පිළිබඳව ලිඛිත සාහිත්‍යය සීමිතය, එබැවින් මෙම අධ්‍යයනය මෙම ආන්තික වූ ප්‍රජාව රටෙහි පශ්චාත් යුධ ආඛ්‍යානයට ඇතුළත් කිරීමේ පළමු උත්සාහයක් ලෙස සැලකිය හැකිය.

මේ සඳහා, මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය එක් ප්‍රජාවක් කෙරෙහි අවධානය යොමු කරනු ඇත - පලන්කුඩි ප්‍රජාව -. මොවුන් බොහෝ දුරට පශ්චාත් යුධ ආඛ්‍යානයේ මායිම මත රැඳී සිටින අතර, යුද්ධය අතරතුර ඔවුන් අවතැන් වීම හේතුවෙන් ඔවුන් මුහුණ දෙන ප්‍රධාන ගැටළු මෙම ලේඛනයෙන් ඉදිරිපත් කරනු ඇත. මෙම ගැටළු විසඳීම සඳහා ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ ද මෙම සංක්ෂිප්තයේ අඩංගු වේ. පලන්කුඩි ප්‍රජාව පරම්පරා ගණනාවක් තිස්සේ ස්වභාවධර්මය හා එකට ජීවත් වුවද, වේගවත් කාර්මිකකරණය, නාගරීකරණය සහ සිවිල් යුද්ධය හේතුවෙන් අවතැන් වීම ඔවුන්ගේ ආවේණික ජීවන රටාවට තර්ජනයක් එල්ල කර ඇත, එය තවදුරටත් සිදුවෙමින් පවතී. පලන්කුඩි ජනයාගෙන් සමහරක් මෙම වෙනස්කම් වලට අනුගත වීමට සමත් වුවද, තවත් බොහෝ අනෙකුන් මෙම වෙනස් වීමේ බලවේගයන් සමඟ අඛණ්ඩව අරගල කරන අතර වෙනස් කොට සැලකීම, කොන් කිරීම, සහ පුද්ගලික සහ රාජ්‍ය නියෝග මත ණය කරවීමේ සහ ඉඩම් කොල්ලකෑමේ ක්‍රියාවලීන්ගේ අනසකටද නතුවී ඇත. මෙහි සංකීර්ණ වූ ප්‍රතිඵලයක් ලෙස, පලන්කුඩි ජනයාට ඔවුන්ගේ ජීවනෝපායන් අහිමි වීමේ සහ ඔවුනට සැපයෙන මූලික සේවාවන් වලට ඇති පහසුකම් වල සීමිත වීමක් දක්නට ලැබේ. මුළු රටම සමස්තයක් වශයෙන් අර්බුදයකට (2022 ආර්ථික හා දේශපාලනික අර්බුධය) මුහුණ දී ඇති මෙවැනි අවස්ථාවක, මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තය සහ එහි එන නිර්දේශයන් වර්තමාන සන්දර්භය තුළ බෙහෙවින්ම අදාළ වේ.

[1] Farooqi, A. & Slenter, F. (2018). *Implementing an Intersectional Approach in the Peace-Building Field*. Global Policy Journal. https://www.globalpolicyjournal.com/blog/13/09/2018/implementing-intersectional-approach-peace-building-field
[2] Ibid.
[3] ප්‍රචණ්ඩත්වය නොමැතිකම යන අර්ථය ඇති 'සෘණාත්මක සාමය' තුළ ශ්‍රී ලංකාව සිටින බව සැලකිය හැකි වුවද, 'ධනාත්මක සාමය' සමාජ සාධාරණත්වයේ පැවැත්ම පිළිබිඹු කරයි (Galtung, J. 1969. Violence, Peace, and Peace Research. *Journal of Peace Research*, *6*(3), 167-191).

# 2. ප්‍රවේශය/ක්‍රමවේදය

දත්ත රැස් කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකා දෙකක් සිදු කරන ලදී; ඉන් පළමු සංචාරය වූයේ පර්යේෂක කණ්ඩායම සන්තෝසපුරම් සහ වෙරුගල් ප්‍රදේශයේ ප්‍රජාව සමඟ විශ්වාසය ස්ථාපිත කර ගැනීමට හා තහවුරු කර ගැනීමට සහ ඔවුන්ගේ ඉතිහාසය සහ සංස්කෘතිය පිළිබඳව ඉගෙන ගැනීමට සතියක පමණ කාලයක් ගත කර තතු දැනගැනීමේ ක්ෂේත්‍ර පරික්ෂාවයි. දෙවන ක්ෂේත්‍ර චාරිකාව සමන්විත වූයේ පර්යේෂණ පැවැත්වීමට සහ ඒවායේ සොයාගැනීම් ඉදිරිපත් කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම සඳහා ගම් දෙකෙහිම තරුණ තරුණියන් සමඟ දින තුනක් පුරා පැවති සහභාගීත්ව පර්යේෂණ (Participatory Research) වැඩමුළුවෙනි. මේ අනුව, මෙම සංක්ෂිප්තයේ සොයාගැනීම් දත්ත රැස්කිරීමේ ක්‍රම දෙකකින් සමන්විත වී ඇත:

1. ප්‍රජා නායකයින් සමඟ පැවති සම්මුඛ සාකච්ඡා,
2. ප්‍රජාවේ තරුණ තරුණියන් සමඟ ඡායාරූපකරණය භාවිතා කරමින් පැවැත්වූ සහභාගීත්ව පර්යේෂණ

## 2.1 ප්‍රජා නායකයින් සමඟ පැවති සම්මුඛ සාකච්ඡා

පළමු ක්ෂේත්‍ර සංචාරයේදී සන්තෝසපුරම් සහ වෙරුගල්හි ප්‍රජාවන්හි ප්‍රජා නායකයින් සමඟ සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. මේවා අර්ධ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ආකෘතියක් (semi-structured interview format) මත පදනම් වූ අතර ප්‍රජාවේ ඉතිහාසයේ සිට ඔවුන්ගේ යුද සමයේ අත්දැකීම් සහ යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස මුහුණ දුන් සමකාලීන ගැටළු දක්වා වූ මාතෘකාවන් මින් ආවරණය කරන ලදී. මෙම සම්මුඛ සාකච්ඡා වල දත්ත මෙහි ඉදිරිපත් කර ඇති ගැටළු සහ ඊට අදාළ නිර්දේශ හැඩගන්වා ඇත.

## 2.2 සහභාගීත්ව පර්යේෂණය

දත්ත එකතු කිරීම සහභාගීත්ව පර්යේෂණ නම් පුද්ගලයින් සමඟ හවුල්කාරිත්වයෙන් පර්යේෂණ පවත්වන "ජීවිත-ලෝක (life-world) සහ අර්ථවත් ක්‍රියාවන් අධ්‍යයනයට ලක් කිරීම”[4] මත පදනම් වූ ක්‍රමවේදයක් හරහා සිදු කර ඇත. සහභාගීත්ව පර්යේෂණ ක්‍රමවේදය සාමාන්‍යයෙන් භාවිතා වන්නේ කලාතුරකින් හඹායන ලද සහ කලාතුරකින් ඇසෙන හඬක් ඇති ආන්තික කණ්ඩායම් අධ්‍යයනය කිරීමේදී ය. මේ අනුව, මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ "මෙම අවබෝධය සහ බලගැන්වීමේ ක්‍රියාවලිය"[5] තුළ සම පර්යේෂකයන්ගේ දැනුම සහ හැකියාවන් ප්‍රතිනිර්මාණය කිරීමයි. මෙම ක්‍රියාවලිය හරහා සම පර්යේෂකයන්ට “ඔවුන්ගේ එදිනෙදා දැනුම, ඔවුන්ගේ අත්දැකීම් සහ අද්විතීය හැකියාව පර්යේෂණ ක්‍රියාවලියට ගෙන ඒමට සහ එමඟින් ඔවුන්ගේම ඉතිහාසයන් සහ අත්දැකීම් පිළිබඳ නව පර්යාලොකයන් සහ වටහාගැනීම් ලබා ගැනීමට”[6]සවිබල ගැන්වේ. .

ඔවුන්ගේ ප්‍රජා අත්දැකීමට අර්ථවත් වන, සුදුසු, සහ නිර්ව්‍යාජ දත්ත නිෂ්පාදනය කිරීම සඳහා පර්යේෂණ ක්‍රියාවලිය පුරාවට ප්‍රජා සාමාජිකයින් සම්බන්ධ කර ගනිමින් මෙහිදී දත්ත රැස් කරන ලදී.[7]ව්‍යාපෘතියේ සම පර්යේෂකයන් වීමට ප්‍රජාවේ තරුණ තරුණියන්ට ආරාධනා කළ අතර ඡායාරූපකරණය භාවිතයෙන් දත්ත රැස් කිරීමට ද පුහුණු කරන ලදී. සම-පර්යේෂකයන් විශ්ලේෂණයට සම්බන්ධ වූයේ ඔවුන් ඡායාරූප කරන දෑ වල ඔවුන්ගේම අවබෝධය සහ වටහාගැනීම ඉදිරිපත් කරමිනි. මේවා පසුව එකතු කර, පටිගත කර පිටපත් කරන ලදී. එබැවින් මෙම ප්‍රතිපත්ති සංක්ෂිප්තයෙන් ඉස්මතු කර ඇති ගැටළු ඡායාරූප සමඟ බැඳී ඇති ආඛ්‍යානවලින් ද උපුටා ගෙන ඇත.

[4] Bergold, J. & Thomas, S. (2012). Participatory Research Methods: A Methodological Approach in Motion. *Historical Social Research / Historische Sozialforschung*, 37(4 (142)), 191–222. http://www.jstor.org/stable/41756482
[5] 2වන පාද සටහන බලන්න
[6] Russo, J. (2012). Survivor-Controlled Research: A New Foundation for Thinking About Psychiatry and Mental Health. *Forum Qualitative Sozialforschung /Forum: Qualitative Social Research*, 13(*1*).
[7]Hergenrather, K.C., Rhodes, S.D., Cowan, C., Bardhoshi, G. & Pula, S. (2009). Photovoice as community-based participatory research: a qualitative review. *American Journal of Health Behaviour*, 33(*6*), 686-98 .

# 3. පලන්කුඩි ජනයාගේ ආඛ්‍යාන/ වෘතාන්ත ඉතිහාසය

The ශ්‍රී ලංකාවේ ආදිවාසී ප්‍රජාව පිළිබඳ ප්‍රථම ලේඛනගත පර්යේෂණය සෙලිග්මන්, C. G. සහ සෙලිග්මන්, Z. යන අයගේ (1911) "The Veddas"[8] නම් ප්‍රකාශනය ලෙස සැලකිය හැක. සෙලිග්මන් සහ සෙලිග්මන් ගේ ලේඛනය "වැදි ජනපද" 12 ක් හඳුනාගන්නා අතර ඉන් එකක් "වෙරළබඩ වැද්දන්" ලෙස හඳුන්වයි. මෙම ප්‍රජාව ශාස්ත්‍රාලයේ බරපතල ලෙස අඩු පර්යේෂණ ප්‍රදේශයක් ලෙස පවතින නමුදු, පවතින ලිඛිත සාහිත්‍ය එකතුවට දායක වීමට සහ ආදිවාසී ප්‍රජාවන්ගේ ඉතිහාසය සහ ජීවිත අත්දැකීම් ලේඛනගත කිරීමට රාජ්‍ය හා පෞද්ගලික ධාරිතාවයෙන් සංරක්ෂණ උත්සාහයන් ගෙන ඇත. 2012 දී, Dilmah Conservation විසින් "Indigenous Communities of Sri Lanka: The Veddas"[9] නමින් අධ්‍යයනයක් සිදු කරන ලද අතර, එය ත්‍රිකුණාමලය, කුන්ජන්කල්කුලම් සහ කල්කුඩා වෙරළබඩ ගම්මානයන්හි පලන්කුඩි ප්‍රජා කොටස් පිළිබඳ ලේඛනගත කර ඇත. එතැන් සිට වෙරළබඩ ආදිවාසී ප්‍රජාව පොදුවේ ශ්‍රී ලාංකීය ආදිවාසී ප්‍රජාවන්ට අදාළ අධ්‍යයනයන් කිහිපයක තුළ දක්නට ඇත. සමාජ සංවිධානයේ ස්වභාවය, "වැද්දන්ගේ" ආර්ථික හා සංස්කෘතික ජීවිතය, ප්‍රාදේශීය වැදි සංස්කෘතිය සහ බහුතර ප්‍රජාව සමඟ ඔවුන්ගේ අන්තර්ක්‍රියාවන්,[10] සිවිල් යුද්ධයෙන් ඔවුන්ගේ ජීවිතවලට ඇති වූ බලපෑම, ආදිවාසී ජීවන රටාවන් කෙරෙහි නවීකරණයෙන් ඇති බලපෑම් වැනි ප්‍රශ්න ද,[11] ආදිවාසී ප්‍රජාවට අදාළව පවතින නීතිමය ව්‍යුහය විශ්ලේෂණය කරන දේශීය නීති සහ ජාත්‍යන්තර නීති සහ ගිවිසුම් අඩංගු අධ්‍යයනයක්[12] ද වර්තමානයේ අනෙකුත් ලිඛිත සාහිත්‍යය එකතුවන් තුළ ඇත. කෙසේ වෙතත්, ව්‍යුහාත්මක ප්‍රචණ්ඩත්වයේ (structural violence) සහ ආන්තිකකරණයේ ප්‍රතිඵලයක් ලෙස පශ්චාත් යුධ සමයේ වෙරළබඩ ආදිවාසී ප්‍රජාව (පලන්කුඩි) සහ ඔවුන් මුහුණ දෙන අභියෝග පිළිබඳව අවධානය යොමු කළ, ගැඹුරු අධ්‍යයනයක් තවමත් බිහි වී නොමැත. ඒ හේතුවෙන්, වෙරළබඩ ආදිවාසී ප්‍රජාව පිළිබඳ විස්තරාත්මක වාර්තා නොමැති වාතාවරණයක් තුළ, මෙම අධ්‍යයනයේදී ද යම් යම් දැනුම් හිඩැස් පිරවීමේ සීමාවන් දක්නට ඇත. එබැවින් මෙම අධ්‍යයනය රටේ පශ්චාත් යුධ ආඛ්‍යානයට මෙම ආන්තිකකරණයට ලක් වූ ජනයා ඇතුළත් කිරීමේ පළමු උත්සාහයක් ලෙස සැලකිය හැකිය. මින් පෙර සිදුකරන ලද අධ්‍යයනයන් බොහෝමයක් ආදිවාසී ප්‍රජාව 'වේදර්', 'වැද්දා', හෝ 'ව(ර්)ඩුවර්' ලෙස හැඳින්වූවත්, මෙම පර්යේෂණයට සහභාගී වූ ප්‍රජාව එම නාමයන් තමන් හැඳින්වීමට භාවිතා කිරීමට කැමැත්තක් නොදැක්වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය, මක්නිසාදයත්, ඔවුන් මෙම පදයන් ඍණාත්මක අත්දැකීම් සහ අර්ථයන් හා සම්බන්ධ කර ඇති බැවිනි.

නගෙනහිර වෙරළබඩ ආදිවාසී ප්‍රජාවන් යනු ස්වභාවධර්මය හා අවට පරිසරය සමඟ සමීපව බැඳී ඇති ඔවුන්ගේම සුවිශේෂී ජීවන රටාවක් ඇති විශේෂිත ජන කණ්ඩායමකි. වෙරළාසන්න ත්‍රිකුණාමලයේ උප්පූරල්, මුතූර්, සාම්පූර්, මාවඩියූටaa, ගෝපාලපුරපට්නම්, සහ තෝප්පූර් අවට ප්‍රදේශ සහ මඩකලපුවේ තවත් සමහර ප්‍රදේශ මෙම ආදිවාසී ප්‍රජාවන්ගේ පාරම්පරික නිජබිම් ලෙස සැලකේ. පලන්කුඩි ප්‍රජාව වනාන්තර, ඇළ දොළ, ගංගා සහ මුහුදු ආධාරයෙන් තම ජීවනෝපායන් සකසා ගෙන ඇති අතර ඒවා පාරම්පරික ජීවනෝපායන් ලෙස සැලකේ. දඩයම් කිරීම, මී පැණි එකතු කිරීම, දර එකතු කිරීම, හේන් වගාව, කලපු මසුන් ඇල්ලීම, සහ වන ද්‍රව්‍ය රැස් කිරීම මෙම ජීවනෝපායන් අතර වේ. ත්‍රිකුණාමලයේ ගම්මාන දෙකක පලන්කුඩි ප්‍රජාව මෙම පර්යේෂණයට සම්බන්ධ වූහ; පළමු ප්‍රජාව ත්‍රිකුණාමලයේ සාම්පූර් හි සන්තෝසපුරම් හි ජීවත් වන අතර මුහුදට වඩා වනාන්තරයට ආසන්නව මොවුන්ගේ ගම්මානය පිහිටා ඇත. ත්‍රිකුණාමලයේ වෙරුගල් ප්‍රදේශයේ ඉලංගෙයි තුරෙයිමුගම්/ මුහත්තුවර් හි දෙවන ප්‍රජාව ජීවත් වන අතර ඔවුන් මුහුදට සමීපව ඔවුන්ගේ ගම්මානය පිහිටවාගෙන එමඟින් ප්‍රධාන වශයෙන් ධීවර ප්‍රජාවක් ලෙස දිවි ගෙවමින් සිටිති.

රටේ නිරිතදිග ප්‍රදේශයේ වෙසෙන ආදිවාසී ප්‍රජාවන් හා සමානවම නැගෙනහිර වෙරළ තීරයේ පලන්කුඩි ප්‍රජාවන් ද ඓතිහාසික කුවේණි රැජිනගෙන් පැවත එන්නන් ලෙස සැලකේ. "කුවේණි ආදිවාසී ජනතා සුභසාධක සමිතිය" (Kuvani Native People Welfare Society) ලෙසින් පිහිටුවා ඇති සන්තෝසපුරම්හි පලන්කුඩි ජනයාගේ සංවිධානයේ නාමයෙන් පවා මෙය ඇඟ වේ. මෙම පෙළපත රටේ දකුණුකරයේ ආදිවාසී ප්‍රජාවන්ට වඩා වැදගත්කමක් ලබා දී ඇති නමුත් (එහි සංස්කෘතික හා ඓතිහාසික වැදගත්කම නිසා සහ සාමාන්‍යය ජනයා ශ්‍රී ලංකාවේ සම්භවය දන්නා පරිදි) පලන්කුඩි ජනයා ආශ්‍රයෙන් මෙම සම්බන්ධතාවය තවමත් හඳුනාගෙන ඇති බවක් දක්නට නොලැබේ. පලන්කුඩි ප්‍රජාව පිළිබඳ ලිඛිත සාහිත්‍යය (ප්‍රධාන වශයෙන් යටත් විජිත යුගයේ මානව විද්‍යාත්මක අධ්‍යයනයන්) උපකල්පනය කරන්නේ මෙම ප්‍රජාවන්, මූලින් දකුණුකරයේ ආදිවාසීන්ගේ ඥාතීන් වූ බවත්, ඉතිහාසයේ කිසියම් අවස්ථාවක දී, සමාජයීය හා භූගෝලීය හේතූන් මත, ඔවුන්ගේ මුල් ගෝත්‍රවලින් වෙන් ව පසුකාලීනව ඔවුන්ටම ආවේණික වූ සංස්කෘතියක් සහ අනන්‍යතාවයක් ගොඩනගා ගනිමින් පලන්කුඩි ජනයා ලෙස ජීවත් වීමට ආරම්භ කළ බවත් ය.

---

[8] Seligmann, C. G. & Seligmann, Z. (1911). *The Veddas*. Cambridge University Press. වෙත යොමු වන්න.
[9] Gankanda, N. & Abayakoon, A. (2012). *Indigenous Communities of Sri Lanka: The Veddahs*. Dilmah Conservation. වෙත යොමු වන්න.
[10] Punchihewa, A. & De Silva, P. (2014). *Socio Anthropological Research Project on Vedda Community in Sri Lanka*. Ministry of Culture and The Arts, Government of Sri Lanka. වෙත යොමු වන්න.
[11] Arunagirinathan, T. (2017, October 12). 'Spotlight – Sri Lanka's Lesser Known Minorities Veddas: The first people of Sri Lanka'. *Roar*. https://roar.media/english/life/culture-identities/veddas-the-first-people-of-sri-lanka වෙත යොමු වන්න.
[12] Uthayakumar, P. (2015). The Rights of Indigenous Peoples in Sri Lanka. *ESCR* E-Newsletter, 16.

# පලන්කුඩි ජනයාගේ ආඛ්‍යාන/ වෘතාන්ත ඉතිහාසය

අභ්‍යන්තර අවතැන්වීම (internal dsiplacement), සිවිල් යුද්ධය, වෙනස් කොට සැලකීම, කොන් කිරීම, සහ අනුගත වීම සහ කරවීම (assimilation) (මෙම සංක්ෂිප්තය මඟින් තවදුරටත් ගවේෂණය කරනු ඇත) සමඟ පොරබැදීමෙන් පසුව, මෙම ප්‍රජාවන්ගේ ස්වයං හඳුනාගැනීමේ ක්‍රියාවලීන් ද වෙනස් වී ඇත; පළමු ක්ෂේත්‍ර සංචාරයේදී වෙරුගල්හි ප්‍රජා නායකයා අප හා කියා සිටියේ ගමෙහි ආදිවාසී පුද්ගලයින් තමන් පලන්කුඩි (දමිළ භාෂාවෙන් සමාජයේ පැරණිතම මිනිසුන් ලෙස පරිවර්තනය වේ) වෙනුවට ආදිකුඩි (දමිළ භාෂාවෙන් සමාජයේ මුල්ම පුද්ගලයින් ලෙස පරිවර්තනය වේ) ලෙස හඳුනා ගැනීමට කැමති බවයි. කෙසේ වෙතත්, පර්යේෂක කණ්ඩායම පසුව සමාජයීය හා ආර්ථික වශයෙන් සැලකිය යුතු ලෙස අඩු මට්ටමක වූ සෙසු ප්‍රජාව සමඟ දිගටම සංවාදයේ යෙදුණු විට හෙළිවූයේ ඔවුන් පලන්කුඩි ලෙස තමන් හැඳින්වීමට කැමැත්තක් දැක්වූ බවයි. අවාසනාවන්ත ලෙස, මෙම පර්යේෂණයේ විෂය පථයෙහි පුළුල් ලෙස ගවේෂණය කළ නොහැකි ස්වයං-හඳුනාගැනීමේ ක්‍රියාවලීන්ට බලපාන පන්ති සහ සමාජ-ආර්ථික තත්ත්වයේ අංගයක් මෙම ගම්මානයේ තිබිය හැකිය.

# 4. ප්‍රතිඵල/ප්‍රධාන ගැටළු

## 4.1 සංස්කෘතියේ මායිම්: අනන්‍යතාවය, ඉතිහාසය සහ සංස්කෘතිය අනුගත වීම/කරවීම සහ මකා දැමීම

අනන්‍යතාවය පිළිබඳ වූ පර්යාලෝකය ප්‍රජාවන් දෙකෙහිම වෙනස් ය; ඔවුන් ජීවත් වන කලාපය තුළ පවතින ප්‍රධාන සංස්කෘතික අනන්‍යතා මත අනුගමනය වෙමින් ප්‍රතිවිරෝධී ජීවමාන යථාර්ථයන් ප්‍රජාවන් දෙක තුළ සුවිශේෂී ලෙස වෙනස් අනන්‍යතා නිර්මාණය කිරීමට දායක වී ඇත. පලන්කුඩි ප්‍රජාවට තමන්ටම අනන්‍ය වූ ඉතිහාසයක් සහ සංස්කෘතියක් ඇති නමුත්, දශක ගණනාවක් මුළුල්ලේ ඔවුන් දමිළ සංස්කෘතියට අනුගත වී සහ කරවී ඇති හෙයින්, වෙරුගල්හි බොහෝ පලන්කුඩි ජනතාව තමන් දමිළ ලෙස ස්වයං-හැඳින්වීමේ තත්ත්වයකට පැමිණ ඇත. මෙම අනුගත වීම සහ කරවීම විවිධ හේතූන් මත පදනම් විය හැක. පළමුවෙන්, දමිළ ජනයා බහුතර වූ ප්‍රදේශයක ජීවත් වීමෙන් ඔවුන් සමඟ අන්තර් ක්‍රියා කිරීමේදී මොවුනට දමිළ භාෂාව ඉගෙන ගැනීමට සිදුවී ඇත, එම නිසා, වසර ගණනාවක් තිස්සේ ඔවුන්ගේ ආවේණික භාෂාවේ භාවිතය සීමා වී ඇති අතර වර්තමානයේ එය කිසිසේත් භාවිතා නොවේ. එම භාෂාව කතා කරන්නේ වැඩිහිටි පරම්පරාවේ ඉතා සුළු පිරිසක් පමණි ප්‍රධාන වශයෙන් මුතූර් ප්‍රදේශයෙන් හමුවන වැඩිහිටියන්ය. දෙවනුව, පලන්කුඩි ප්‍රජාව සාමාන්‍යයෙන් දමිළ ජනතාව විසින් කොන් කර ඇත්තේ ඔවුන් දමිළ ප්‍රජාවන් ඇතුළත 'පහත් කුලයක්' ලෙස සැලකෙන බැවිනි. ආදිවාසී ප්‍රජාව හඳුනා ගැනීම සඳහා දමිළ භාෂාවේ භාවිත වන 'ව(ර්)ඩුවර්' යන යෙදුම 'පහත් කුලය' සහ 'අපිරිසිදු' බව පිළිබිඹු කරන බැවින් එය අවමන් සහගත යැයි සැලකේ. එම නිසා, ඔවුන් තමන්ගේ ආදිවාසී අනන්‍යතාවයේ ගෞරවය තහවුරු කරන 'පලන්කුඩි' හෝ 'ආදිකුඩි' යන නාමයන්ගෙන් තමන් හඳුනා ගනී.

එපමණක් නොව, දමිළ සටන්කාමීන් ඔවුන් ජීවත් වූ ප්‍රදේශ පාලනය කළ යුගයේදී ද ඔවුන්ගේ අනන්‍යතාවය නැතිවී යාමට හේතුවක් විය - වෙරුගල්හි ප්‍රජා නායකයා ප්‍රකාශ කළ පරිදි දෙමළ ඊළාම් විමුක්ති කොටි සංවිධානය (එල්.ටී.ටී.ඊ.) විසින් පලන්කුඩි ජනයා හට දමිළ ජනයා සේ ජීවත් වන ලෙසට එකල පවසා ඇත. අන්තර් ප්‍රජා විවාහයන් (inter-community marriages) ද අනුගත වීමේ සහ කරවීමේ ක්‍රියාවලීන් වලට දායක වී ඇත; දෙමාපියන්ගෙන් එක් අයෙක් දමිළ නම්, තරුණ පරම්පරාවන් තමන් පලන්කුඩි ලෙස හඳුනා නොගෙන දමිළ ලෙස හඳුනා ගැනීම දැකිය හැකි විය. මෙය විශේෂයෙන්ම වෙරුගල් ප්‍රදේශදී දැකිය හැකි වුනු අතර, දත්ත රැස් කරන අවධියේදී තම දෙමාපියන් සමඟ කතා කරන තුරු ඇතැම් සම පර්යේෂකයන් තමන් පලන්කුඩි යැයි නොදැන සිටියහ.

ආයතනමය පිළිගැනීමක් නොමැතිකම ද පලන්කුඩි අනන්‍යතාවය මැකී යාමට මඟ සකසා ඇත. උදාහරණයක් ලෙස, උප්පැන්න සහතික සහ ජාතික හැඳුනුම්පත් (NIC) නිෂ්පාදනය කිරීමේදී රජය විසින් පලන්කුඩිවරුන්ගේ අනන්‍යතාවය හඳුනා නොගනී. එක් ප්‍රජා නායකයෙකු සිහිපත් කළ පරිදි, අතීතයේ දී ඔවුන්ගේ උප්පැන්න සහතිකවල ඔවුන්ගේ අනන්‍යතාවය ලෙස පෙන්නුම් කර ඇත්තේ ‘පලන්කුඩි’ යනුවෙනි; කෙසේ වෙතත්, ජාතික හැඳුනුම්පත ඔවුන්ව හඳුන්වන්නේ ‘ශ්‍රී ලාංකික දමිළ’ වශයෙනි. තරුණ පරම්පරාවේ උප්පැන්න සහතිකවල ඔවුන් හඳුනාගෙන ඇත්තේ පලන්කුඩි ලෙස නොව ශ්‍රී ලාංකික දමිළ ලෙසයි. තම උප්පැන්න සහතිකවල සහ ජාතික හැඳුනුම්පත්වල මෙම හැඳුනුම ඉල්ලා සිටීමේ අයිතිය පිළිබඳව ප්‍රජාව දැනුවත් කර නොතිබීම ද මෙයට හේතු විය හැක.

පලන්කුඩි අනන්‍යතාව මැකී යාම දමිළ ප්‍රජාවෙන් වෙන්කර හඳුනා ගැනීමට අවශ්‍ය නොවන හෙයින් ඔවුන්ට අනන්‍ය වූ සංස්කෘතික අංගයන් ඉටු කිරීම නැවැත්වූ ආකාරයෙන් ද පැහැදිලි වේ. සන්තෝසපුරම්හි පලන්කුඩිවරුන් ස්වභාවයෙන්ම හුදකලාව ජීවත් වූ බැවින් තවමත් ඔවුන්ට අනන්‍ය වූ ආගමික හා සංස්කෘතික සම්ප්‍රදායන් සහ චාරිත්‍ර හි විවෘතව නිරත වෙති. මෙතරම් වූ අනුගත වීම්/කරවීම් සහ අනන්‍යතාවය මකා දැමීම් ඇති කර ඇති තත්ත්වය වන්නේ හින්දු ආගමික උත්සවවලදී පලන්කුඩිවරුන්ට හිමිවිය යුතු ස්ථානය ඔවුන්ගෙන් උදුරා ගැනීමයි. උදාහරණයක් ලෙස, උර්වාලම් උත්සවයේදී, දේව ප්‍රතිමාව පෙරහැරේ වැඩම කරවීමේදී පලන්කුඩි ප්‍රජාව ඉතාමත් වැදගත් කාර්යභාරයක් ඉටු කරන නමුදු, දමිළ ප්‍රජාව විසින් වෙරුගල්හි පලන්කුඩි ප්‍රජාවට මෙම භූමිකාව තවදුරටත් රඟ දැක්වීම තහනම් කර ඇත. දමිළ ප්‍රජාව මෙම සම්ප්‍රදාය නැවත ආරම්භ කර ඇති අතර, ඔවුන් වෙරුගල්හි පලන්කුඩි ප්‍රජාව වෙනුවාට මෙම කාර්යභාරය ඉටු කරන ලෙස පාල්සේනයි සහ වාකරෙ ප්‍රදේශයන්හි පලන්කුඩි ප්‍රජාවට ආරාධනා කර ඇත.

# ප්‍රතිඵල/ප්‍රධාන ගැටළු

## 4.2 දරිද්‍රතාවයේ මායිම්

### 4.2.1 මූලික සේවාවන්ට ඇති අඩු පහසුකම්

යුද්ධය අතරතුර අවතැන්වීම් හේතුවෙන්, මූලික සේවාවන් සඳහා ඇති පහසුකම් අඩු වීම සහ අහිමි වීම්, විශේෂයෙන්ම ජලාපවහනය සහ විදුලිය, සන්තෝසපුරම් ප්‍රදේශයේ ප්‍රජාව මුහුණ දෙන ප්‍රධාන ගැටළු වලින් දෙකකි. සන්තෝසපුරම් ප්‍රදේශයට ජලය සැපයීම යම් ප්‍රමාණයක් සිදු වුවද, මෙම ජනයාට තම නිවෙස්වලට නව ජල නළ මාර්ග ලබා ගැනීමට හැකියාවක් නැත; සමෘද්ධි (සුභසාධන) ප්‍රතිලාභ වැනි රජයේ සහනාධාර සඳහා සුදුසුකම් ලැබුවද, එය ජල පහසුකම් ලබාගැනීමට තරම් ප්‍රමාණවත් වන්නේ නැත. එබැවින්, සන්තෝසපුරම් හි පලන්කුඩි ප්‍රජාවට අවට කෝවිල් සහ පාසල් වල ඇති ළිං මත යැපීමට සිදුව ඇත, නමුත් එයද වෙනත් ප්‍රජාවන් විසින් ඔවුන්ට ගැවසීමට තහනම් ස්ථාන යැයි පවසා ඇත. සන්තොසපුරම්හි ප්‍රජා නායකයාට අනුව, මෙය සාම්පූර්හි පලන්කුඩි ප්‍රජාව වෙනස් කොට සැලකීමට හේතුවක් ලෙස බොහෝ විට හුවා දක්වන "අපේ ගඳ නිසා අපි පිරිසිදු නැත" යන චිරස්ථායී මතයට එකතු කර ඇත.

එපමණක්ද නොව, යුද සමයට පෙර ස්වභාවික උල්පත් ජලය භාවිතයට හුරුවී සිටි මොවුන් විශ්වාස කරන්නේ දැන් ලබා ගත හැකි ජලය ක්ලෝරීන් මාර්ගයෙන් පිරිසිදු කර ඇති නිසා ඒවා පිරිසිදු නොවන බවයි. පිරිසිදු පානීය ජලය නොමැතිකම මෙම ප්‍රදේශයේ ප්‍රජාව අතර මුත්‍රා හා වකුගඩු රෝග වැඩිවීමට හේතු විය හැකි ආකාරය ද ඔවුහු පැහැදිලි කළහ - විශේෂයෙන්ම සන්තෝසපුරම් ප්‍රදේශයෙහි. ඒ හා සමානව, රෝහල් සහ සෞඛ්‍ය සේවා සඳහා පහසුකම් නොමැතිකම ද මෙම ප්‍රජාව විසින් මුහුණ දෙන තවත් ප්‍රශ්නයකි, ඔවුන් විශ්වාස කරන ආකාරයට, ඔවුන්ට වඩා උගත් සහ/හෝ ධනවත් අනෙක් ප්‍රජාවන් එවැනි සේවාවන් වෙත ඇති ප්‍රවේශය මොවුනට වසා දමා ඇති බවයි. මීට අමතරව, පොදු ප්‍රවාහනය ද මෙම ගමෙහි සීමිත වන අතර, ගමේ සිට ළඟම නගරයට සෘජු බස් මාර්ගයක් නොමැත; එම නිසා බොහෝ මිනිසුන්ට පයින් හෝ බයිසිකලයෙන් ගමන් කරති. කෙසේ වෙතත්, සෞඛ්‍ය සේවා හෝ අධ්‍යාපනය වැනි මූලික සේවාවන් හට ඇති පහසුකම් අඩු වීම සහ අහිමි වීම දරිද්‍රතාවයේ මායිම් මත ඇති ගැටළු තවත් සංකීර්ණ කරයි.

### 4.2.2 ගුණාත්මක අධ්‍යාපන පහසුකම් අඩු වීම

මෙම බලහත්කාර ලෙස හෝ ස්වේච්ඡාවෙන් වන අනුගත වීම් වලින් සාධනීය ප්‍රතිඵල ද බිහිවිය හැක. සන්තෝසපුරම්හි පලන්කුඩි ප්‍රජාව සහ වෙරුගල්හි පලන්කුඩි ප්‍රජාව අතර අධ්‍යාපන මට්ටමේ පැහැදිලි වෙනසක් දැකිය හැක. සන්තෝසපුරම් ප්‍රජාවට අනෙක් ප්‍රජාවට සාපේක්ෂව සාමාන්‍යයෙන් අඩු අධ්‍යාපන මට්ටමක් තිබුණි. මෙම ජනයා වඩාත් තමන්ගේ පලන්කුඩි මූලයන් මත පදනම් ව ජීවත් වන හෙයින්, සන්තෝසපුරම්හි දරුවන් වෙනත් ප්‍රජාවන් සමඟ ද්විතීයික පාසලකට යන විට වෙනස් කොට ලෙස සලකනු ලබයි. උදාහරණයක් වශයෙන්, ක්‍රීඩා, කලා, සහ සංස්කෘතික ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට පලන්කුඩි ළමයින් පාසල විසින් හිතාමතාම තෝරා නොගනී. ඔවුන් වෙනත් ළමයින්ගෙන් හිරිහැරයට ද ලක් වන අතර සමහර විට ඔවුන් 'අපිරිසිදු' ලෙස දකින නිසා ඔවුන්ට පොදු ජලය පහසුකම්වත් භාවිතා කිරීමට අනෙක් ළමයින් ඉඩ නොදේ. සන්තෝසපුරම් ගම්මානයට වෙනමම ප්‍රාථමික පාසලක් ඇති හෙයින් ද්විතීයික පාසලේදී මෙන් ප්‍රාථමික පාසලේදී දරුවන්ට හිරිහැර වලර මුහුණ පෑමට සිදු නොවේ. මෙම ගැටලුවෙන් චක්‍රීය බලපෑමක් ද ඇත, මන්දයත්, පිරිසිදු ජලය සඳහා පහසුකම් නොමැති වීම මෙම ප්‍රජාවට අඩු සනීපාරක්ෂක මට්ටමක ජීවත් වීමට බල කර ඇත. එය පාසල්වල ළමයින්ට වෙන් කොට සැලකීමට හේතුවක් ලෙස හඳුනා ගෙන ඇති අතර එය බොහෝ විට ඔවුන්ගේ අධ්‍යාපනය සම්පූර්ණ නොකර ඔවුන්ට පාසලෙන් ඉවත් වීමට ද බල කරයි. සන්තෝසපුරම් ගම්මානයට ළඟම ඇති ද්විතීයික පාසල බොහෝ දුරින් පිහිටා ඇත; මෙයද තවත් පාසල් හැරයාමට හේතුවක් වේ. ගම්වාසීන්ට අනුව, මෙය ගැහැණු ළමයි කෙරෙහි අසමානුපාතික බලපෑමක් ඇති කරයි. මෙම සංකීර්ණ ගැටළු හේතුවෙන් ගැහැණු ළමයින් පාසල් සම්පූර්ණ කිරීමට නොපෙළඹෙන අතර නව යොවුන් වියේදී විවාහ වී දරුවන් සෑදීමට වන වාතාවරණයක් ඇති කරයි.

අනෙක් අතින්, වෙරුගල්හි ළමයින් ඔවුන්ගේ අධ්‍යාපනය අවසන් කිරීමේ දී මෙවැනි ප්‍රශ්නවලට මුහුණ දෙන බවක් පෙනෙන්නට නැත. ඉතා සුළු ප්‍රතිශතයක් වුවද, ඇතැමුන් විශ්වවිද්‍යාල අධ්‍යාපනය පවා අවසන් කරති. සන්තෝසපුරම් ප්‍රජාවට වඩා දමිළ ප්‍රජාව සමඟ අනුගත වීම මෙයට හේතු විය හැක. මෙය ඔවුන් සමාජයේ ඉහළට යෑමට සහ වේගයෙන් අනෙකුන් සමඟ ඒකාබද්ධ වීමට දායක වී ඇත; සමහර අවස්ථාවලදී අනුගත් වීම සහ කරවීම ධනාත්මක බලපෑම් ද ඇති කරන බව වටහා ගත හැකි සාධකයක් ලෙස මෙය දැකිය හැක.

# ප්‍රතිඵල/ප්‍රධාන ගැටළු

### 4.2.3 ජීවනෝපායන් අහිමි වීම සහ ආහාර සුරක්ෂිතතාවය නොමැති වීම

ඉඩම් කොල්ලය සහ පාරම්පරික ඉඩම් අහිමි වීම මොවුනට කෘෂිකාර්මික කටයුතුවල නියැලීමට ඇති හැකියාව නැති කොට ඇත. මෙය ඔවුන්ගේ ආදායම් උත්පාදනය සම්ප්‍රදායික ජීවනෝපායන් සහ ත්‍රිකුණාමලයෙන් පිටත දෛනික වැටුප් ශ්‍රමික ශ්‍රමයට සීමා කර ඇත. ප්‍රජාවේ නායකයාට අනුව, සාම්ප්‍රදායික ජීවනෝපායන් මත යැපීම ද සීග්‍රයෙන් දුෂ්කර බවට හැරෙමින් පවතී. උදාහරණයක් වශයෙන්, ඔවුන්ගේ සාම්ප්‍රදායික ජීවනෝපාය මාර්ගයක් වන මී කැඩීම මොවුන්ට තහනම් වී ඇති අතර, වනාන්තර විනාශ කිරීම සම්බන්ධයෙන් පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීමට ද මුහුණ දීමට සිදුව ඇත. කෙසේ වෙතත්, මෙම ජීවනෝපායේ යෙදෙන අනෙකුත් ප්‍රජාවන්ට එලෙසම සලකනු නොලබයි. තවද, 'නව' අයිතිකරුවන්ගෙන් අවසරයකින් තොරව තම පාරම්පරික ඉඩම්වලින් දර එකතු කිරීමට ද මෙම ප්‍රජාවට අවසර අහිමි වී ඇත. මේ අනුව, දැකගත හැකිවන්නේ, නීතිය ක්‍රියාත්මක කිරීමේ පාර්ශ්වයෙන් ආදිවාසී ප්‍රජාවන්ගේ සාම්ප්‍රදායික ජීවනෝපායන් පිළිබඳ නොදැනුවත් බවත් ඔවුන් පලන්කුඩ් ජනයාට එරෙහිව පැහැදිලි වෙනස්කම් කිරීමක් සිදු කරන බවයි.

ස්වභාවයෙන්ම තිරසාර වන පලන්කුඩ් කෘෂිකර්මය සඳහා නිසි ආයතනමය සහයෝගයක් සහ පිළිගැනීමක් නොමැති හෙයින්, රසායනික පොහොර සහ අනෙකුත් කෘෂි රසායන මත යැපෙන නවීන කෘෂිකාර්මික පිළිවෙත්වලට අනුගත වීමට මෙම ප්‍රජාවන්ට සිදු වී ඇත. කෙසේ වෙතත්, හදිසියේම රසායනික පොහොර සහ කෘෂි රසායන ආනයනය කිරීම තහනම් කිරීම සහ ඉන්පසුව මතු වූ ගැටළු[13] ගොවීන්ට තවදුරටත් බලපෑ අතර එය ඔවුන් අතර දැඩි ආහාර අනාරක්ෂිතභාවයක් ඇති කර ඇත. වත්මන් ආර්ථික අර්බුදයටත් පෙර සිටම මොවුන් නිරපේක්ෂ දරිද්‍රතාවයේ වින්දිතයින්ව සිටි හෙයින්, ඔවුන් කෙටිකාලීනව ද ආර්ථික හා ආහාර අර්බුදවලට අසමානුපාතිකව මුහුණ දිය හැකි අතර දිගු කාලීනව ද උග්‍ර සමාජ විෂමතාවයන්ට නතු වනු ඇතැයි අපේක්ෂා කළ හැක.

## 4.3 යුද්ධයේ මායිම්

### 4.3.1 බලහත්කාරයෙන් ඉවත් කිරීම සහ අභ්‍යන්තර අවතැන්වීම

සිවිල් යුද්ධය පැවති සමයේ යුද්ධයේ ප්‍රතිඵලයක් මෙන්ම සුනාමිය වැනි ස්වභාවික විපත් හේතුවෙන් ද පලන්කුඩ් ජනයා අභ්‍යන්තරව අවතැන් වූහ. මුතූර් සහ ඊට තදාසන්න ප්‍රදේශවල ජීවත් වූ පලන්කුඩ් පුද්ගලයන් යුද්ධය අතරතුර තුන් වතාවක් පමණ අභ්‍යන්තරව අවතැන් වූ නමුදු, ඔවුන්ට ආපසු තම ඉඩම් වෙත යාමට පසුකාලීනව හැකි විය. මෙහි ප්‍රතිඵලය වූයේ පශ්චාත් යුධ සමය තුළ දී පවා පලන්කුඩ් ජනයා දිගටම පොරබදමින් සිටින ඉහත ඉදිරිපත් කරන ලද අනෙකුත් ගැටළු ය. එසේම, 2004 වසරේ ඇති වූ සුනාමි ව්‍යසනය හේතුවෙන් වෙරුගල් ප්‍රජාවද අවතැන් වූ අතර, ඒ හේතුවෙන් ශිෂ්ටාචාරයේ මූලාරම්භ වූ පාරම්පරික නිජබිම් දැන් පාළුවට ගොස් ඇත; සුනාමි ඛේදවාචකය හේතුවෙන් එම ප්‍රජාව දැන් මහ සයුර අභියස නැවත පදිංචි වීමට බියක් දක්වති.

ඔවුන්ගේ පාරම්පරික ඉඩම්වලින් බලහත්කාරයෙන් නෙරපා හැරීමෙන් සිදුවූයේ ස්වභාවධර්මය හා සමීපව බැඳී ඇති ආදිවාසී ජීවන රටාවට වඩා වෙනස් ජීවන රටාවකට පලන්කුඩ් ජනයාට හුරු වීමයි. ඊට උදාහරණ ලෙස, ජල මූලාශ්‍රවල වෙනස්වීම්, වගා කිරීමට ඇති හැකියාව යනාදිය මෙලෙස වෙනස් විය. යුද සමයේදී එල්.ටී.ටී.ඊ. ය විසින් ඔවුන්ගේ ගම්මානය අත්පත් කර ගැනීම හේතුවෙන්, සන්තෝසපුරම් ප්‍රජාව හට තවත් රට අභ්‍යන්තරයට යෑමට සිදු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, ඔවුන් ස්වභාවික ජල මූලාශ්‍ර ආදියෙන් ඈත් විය. 2002 වසරේදී රජය මඟින් දියත් කළ නිවාස ව්‍යාපෘතියක් හරහා අවතැන්වීම් හේතුවෙන් නිවාස නොමැති පලන්කුඩ් ප්‍රජාව සඳහා නිවාස 100ක් පමණ ඉදිකරන ලදී. නමුත්, මෙය ඔවුන්ගේ ජීවන රටාවේ වෙනසක් ඇති කිරීමට හේතු වූ අතර එය පලන්කුඩ් වැඩිහිටි පරම්පරාව අගය නොකරයි, මක්නිසාදයත්, ඔවුන්ගේ ජීවන රටාව ඊට පෙර සොබාදහම සමඟ ඉතාමත් සමීපව බැඳී තිබූ බැවිනි.

[13] 2021 අප්‍රේල් මාසයේදී ශ්‍රී ලංකාව රසායනික පොහොර සහ කෘෂි රසායන ආනයනය සම්පූර්ණයෙන්ම තහනම් කළේය. තහනම 2021 අප්‍රේල් 26 දින ක්‍රියාත්මක වූ අතර 2021 නොවැම්බර් මාසයේදී අත්හිටුවන ලදී. කෙසේ වෙතත්, අස්වනු මත මෙහි ඇති බලපෑම දිගටම පවතී.

# ප්‍රතිඵල/ප්‍රධාන ගැටළු

## 4.3.1 මිලිටරිකරණය සහ බෞද්ධකරණය

පසුගිය වසර කිහිපය තුළ උතුර සහ නැගෙනහිර ප්‍රදේශවල බහුලව දක්නට වූ ප්‍රශ්නයක් නම්, පශ්චාත් යුද සමය තුළ පවා ඉහළ සෝදිසි කිරීම් සහ ඉඩම් කොල්ලකෑම් පමණක් නොව උතුරු නැගෙනහිර 'බෞද්ධකරණයට'[14]ද තුඩු දුන් ඉහළ වූ මිලිටරිකරණයයි. බෞද්ධකරණය හේතුවෙන් පලන්කුඩි ආගමික ස්ථානයක් තමන්ට අහිමි වූ බව වෙරුගල්හි පලන්කුඩි ජනයා ප්‍රකාශ කළහ. මෙය පලන්කුඩි ප්‍රජාව විසින් පූජනීය ලෙස සලකනු ලබන මලෙලමේනි අම්මන් දේවිය සඳහාම වෙන්වූ පූජනීය ස්ථානයකි, ඔවුන් විශවාස කරන ආකාරයට 2004 දී සුනාමි ඛේදවාචකයෙන් ආශ්චර්යමත් ලෙස ඔවුන්ව බේරා ගත්තේ මලෙලමේනි අම්මන් දේවියයි. 2006 දී ගුවන් ප්‍රහාරයකින් මෙම පූජනීය ස්ථානය විනාශ විය, නමුත් 2008 දී එම ශුද්ධ භූමිය හමුදාව විසින් අත්පත් කර ගෙන බුද්ධ ප්‍රතිමාවක් ස්ථාපිත කරන ලදී. වෙරුගල්හි පලන්කුඩි ප්‍රජාවට බෙහෙවින් වැදගත් වන මෙම දේවිය දැන් පාර අයිනේ කුටියක තැන්පත් කර ඇත.

## 4.3.2 ඉඩම් කොල්ලය

සිවිල් යුද්ධයට පෙරාතුව සහ පසුව එදිරිවාදිකම් සහ අභ්‍යන්තර අවතැන්වීම් නිසා තවත් උග්‍ර වූ ප්‍රශ්නයක් වන්නේ මුතූර්හි පලන්කුඩි ජනයාගේ පාරම්පරික ඉඩම් අහිමි වීමයි. 1976 දී වංචාකාරී ලෙස මුතූර්හි පලන්කුඩි ප්‍රජාවට භාණ්ඩ බෙදා හැරීමේ ක්‍රියාවලියක් මඟින් ඔවුන් ණය කරුවන් බවට පත් කිරීමට අනෙක් ප්‍රජාවන්හි සාමාජිකයින් සමත් වූ අතර, පසුව මෙය පලන්කුඩි ජනයාට ඔවුන්ගේ ඉඩම් ණය හිමියන්ට බාර දීමට බල කිරීමට නිදහසට කරුණක් ලෙස භාවිතා කරන ලදී. ඉන්පසු ඔවුන් නැවත පදිංචි වූ ඉඩම් සිවිල් යුද්ධය පැවති සමයේ දී එල්.ටී.ටී.ඊ. ය, ගොවීන්, සහ අවට බහුතර ජනවාර්ගික ප්‍රජාවන්හි ධනවත් පුද්ගලයින් විසින් බලහත්කාරයෙන් පැහැර ගන්නා ලදී. යුද්ධයෙන් පසු ඔවුන් නැවත සිය ගම්මානයට පැමිණියද, සන්තෝසපුරම්හි පලන්කුඩි ජනයාට අයත් අක්කර 75-80 ක පමණ ඉඩම් 2010/2011 වසර වල දී රාජ්‍ය බලධාරීන් විසින් යෝජිත තාප බලාගාර ව්‍යාපෘතියක් සඳහා වෙන් කරන ලදී. එහෙයින්, පාරම්පරික ඉඩම් ලෙස හඳුනාගත් ඉඩම් වලට ඇති ප්‍රවේශය සහ අයිතිය මොවුනට නැති වූ අතර, මෙහි ප්‍රතිඵලයක් ලෙස කෘෂිකාර්මික කටයුතු වලට ඇති ඉඩකඩ අඩු වීම සහ පිරිසිදු පානීය ජලය ලබා ගැනීමට බාධාවන් ඔවුන්ගේ ස්වයං පෝෂිත පැවැත්මට ද බලපෑවේය. දැන් 'අධි ආරක්ෂිත කලාපයක්' ලෙස සීමා කර ඇති ඇතුළු වීමට තහනම් වූ මෙම ඉඩමෙහි ආගමික සිද්ධස්ථානයක් ද ඇතුළත් ය. මුතූර් පලන්කුඩි ප්‍රජාවේ ඉඩම් කොල්ලකෑම සහ ණය බර බලහත්කාරයෙන් පැටවීම එම ප්‍රජාව දරිද්‍රතාවයේ සිර කර දේපළ අහිමි කරවීමට වඩා දුරදිග යන ප්‍රතිවිපාක ගෙන එන ප්‍රශ්න ගොන්නකි.

## 4.3.3 බලහත්කාරයෙන් බඳවා ගැනීම් සහ බලහත්කාරයෙන් අතුරුදහන් කරවීම්

යුධ සමයේදී මෙම ප්‍රදේශයේ ළමා සොල්දාදුවන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය මොවුන්ට බලපෑවේ එම තරුණයින් ඉතාමත් බාල වියේදී බඳවා ගත් බැවිනි. ඇතැමුන් බලහත්කාරයෙන් බඳවා ගනු ලැබුවද තවත් අයවලුන් අධ්‍යාපන අවස්ථා නොමැතිකම හෝ ආදායම් ඉපැයීමේ ක්‍රමයක් නැති හේතුවෙන් එක් වූහ. බොහෝ දෙනෙක් යුද්ධයෙන් පසු ආපසු නොපැමිණි අතර අතුරුදහන් වූවා යැයි හෝ මිය ගියා යැයි විශ්වාස කෙරුණි. අතුරුදහන් වූවන් පිළිබඳ සොයා බැලීමට සහ ඔවුන්ගේ පවුල්වලට උපකාර කිරීමට යාන්ත්‍රණයක් තිබියදීත්, අතුරුදහන් වූවන්ගේ කාර්යාලය (OMP) වෙත ප්‍රවේශ විය නොහැකි බවත් හෝ එයින් උපකාරයක් නොවන බවත් මොවුන් විසින් වටහා ගන්නා ලදී.

[14] 'බෞද්ධකරණය' යනු සමාජය සහ එහි ක්‍රියාකාරීත්වය මත බෞද්ධ සාරධර්ම බලහත්කාරයෙන් පටවන ව්‍යුහාත්මක වූ ක්‍රියාවලියයි. මෙම අවස්ථාවෙහිදී, බෞද්ධකරණය යනු මෙම කලාපය තුළ බුද්ධාගම සහ බෞද්ධ සාරධර්ම පැටවීමට පක්ෂව පලන්කුඩි සංස්කෘතිය සහ ආගම රාජ්‍ය අනුග්‍රහය ඇතිව මිලිටරිකරණය හරහා නැති කිරීමයි.

# 5. නිගමනයන්



- පශ්චාත් යුධ සන්දර්භය තුළ යුද සමයේ පාලනය හා ආයතනමය පිළිගැනීමක් නොමැතිකම පලන්කුඩි ජනයා ඔවුන් අවට ඇති ප්‍රමුඛ හා බහුතර සංස්කෘතියට අනුගත වීමට සහ කරවීමට හේතු වී ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස පලන්කුඩි අනන්‍යතාවයෙහි අද්විතීය අංගයන් බොඳ වී යාම සහ සමහර අවස්ථාවල සම්පූර්ණයෙන්ම නැති වීම ද සිදු වී ඇත. එක් අතකින්, එවැනි අනුගත වීම් හෝ කරවීම් යමෙකුගේ සංස්කෘතිය, භාෂාව, සහ සම්ප්‍රදායන් නැතිවීමට ද පුරාණ ශිෂ්ටාචාරයන් සමඟ බැඳී ඇති අනන්‍යතා අකා මකා දැමීම වැනි සෘණාත්මක බලපෑම් ඇති කළ හැකිය. අනෙක් අතින්, වෙරුගල් ප්‍රජාව පෙන්වා දී ඇති පරිදි අධ්‍යාපනය සහ ඉහළ සමාජ හා ආර්ථික සංවර්ධනයක් හා වඩා හොඳ අවස්ථා ලැබීම වැනි දෑ අනුගත වීමෙන් හෝ කරවීමෙන් ප්‍රජාවට ප්‍රතිලාභයක් ඇති දෑ ලෙස ඇතිවිය හැක.

- ආදිවාසී අනන්‍යතාවය සඳහා ආයතනමය පිළිගැනීමක් නොමැතිකම මගින් මොවුන් අන්ත දරිද්‍රතාවයටත්, මූලික අයිතිවාසිකම් වල පිළිනොගැනීමකටත්, සහ මූලික සේවාවන් සඳහා ඇති පහසුකම් වල සීමාවලටත් භාජනය වී ඇත. උදාහරණයක් ලෙස, සන්තෝසපුරම් හි ප්‍රජාවට පිරිසිදු ජලය සඳහා සීමිත පහසුකම් ඇති අතර එය එම ප්‍රජාව තුළ වක්‍රීය බලපෑමක් ඇති කිරීමට හේතු වී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස 'නිසි' සනීපාරක්ෂක ප්‍රමිතීන් පවත්වා ගැනීමට නොහැකි වීම නිසා ළමයින්ට ද වෙනස් කොට ලෙස සැලකීමට බඳුන් වී පාසලෙන් බැහැරව යාමටද සිදුව ඇත. අධ්‍යාපන සුදුසුකම් නොමැතිකම හෝ අඩුකම හේතුවෙන් මෙම ප්‍රජාව දරිද්‍රතාවයේ සිරවී සිටින අතර ආදිවාසී/පලන්කුඩි අයිතීන් වෙනුවෙන් පෙනී සිටීමට මොවුන්ට තවමත් අවශ්‍ය දැනුමක් හෝ සාක්ෂරතාවයක් නොමැත.

- ඉඩම් කොල්ලය, වන විනාශය තහනම් කිරීම, සහ කෘෂිකාර්මික නවීකරණය වැනි දෑ හේතුවෙන් ඔවුන්ගේ සාම්ප්‍රදායික ජීවනෝපායන් අවදානමට ලක්ව ඉන් මෙම ප්‍රජාව වර්තමානයේදී දැඩි ආහාර අනාරක්ෂිතතාවයකට මුහුණ දී ඇත. මෙය සමස්තයක් වශයෙන් ආදිවාසී ප්‍රජාවන් ලෙස ඔවුන්ගේ අයිතිවාසිකම් සඳහා ආයතනමය පිළිගැනීමක් නොමැතිකම හා සම්බන්ධ වේ.

- අධ්‍යයනය කරන ලද ප්‍රජාවන් දෙකම සිවිල් යුද්ධය සහ 2004 සුනාමිය හේතුවෙන් අභ්‍යන්තරව අවතැන් වී ඇත. මෙය ඉඩම් අත්පත් කර ගැනීම සහ බලහත්කාරයෙන් ඉවත් කිරීම වැනි ගැටළු වලට ඉන් ඔබ්බට මතු වූ සංකීර්ණ වූ ගැටළු වලටත් තුඩු දී ඇති අතර (ඉහත සාකච්ඡා කළ පරිදි) මෙම ප්‍රජාවන් තවදුරටත් දරිද්‍රතාවයේ ද සිර කර ඇත.

- සිවිල් යුද්ධයේ දෙපාර්ශවයටම මැදිව මෙම ප්‍රජාව සෘජුවම ඔවුන්ගේ ගොදුරක් විය; ඔවුන්ගේ තරුණයින් එල්.ටී.ටී.ඊ. ය විසින් බලහත්කාරයෙන් බඳවා ගන්නා ලද අතර රජය විසින් ද බලහත්කාරයෙන් අතුරුදහන් කරවන ලදී. කෙසේ වෙතත්, මෙම ප්‍රජාවන්ට තවමත් යුක්තිය ඉටු වී නොමැති අතර, OMP වැනි පශ්චාත් යුධ යුක්ති යාන්ත්‍රණයන්ට ප්‍රවේශ වීම ද දුෂ්කර වී ඇත. තවද, මෙය පශ්චාත් යුධ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට පහසු

- මිලිටරිකරණය තවමත් උතුරු නැගෙනහිර ප්‍රදේශවල බහුලව පවතින අතර එය පලන්කුඩි ප්‍රජාවට සෘජුවම බලපායි. අධික සෝදිසි කිරීම් වලට අමතරව මෙම ප්‍රජාවට සහ ඔවුන්ගේ ආගමික ස්ථාන වලට බෞද්ධකරණයට ද මුහුණ දීමට සිදු ව ඇත.

# 6. ප්‍රතිපත්ති නිර්දේශ

මෙම ප්‍රජාව මුහුණ දෙන ගැටළු බොහොමයක් ආදිවාසී අනන්‍යතාව සහ අයිතිවාසිකම් සඳහා ආයතනමය පිළිගැනීමක් නොමැතිකම මගින් තවත් සංකීර්ණ වී ඇති බව මෙම පර්යේෂණය හඳුනා ගනී. එබැවින්, මෙහි ඉදිරිපත් කරනු ලබන නිර්දේශ බොහොමයක් පලන්කුඩ් ප්‍රජාව සඳහා ආයතනමය පිළිගැනීමකට ඇති අවශ්‍යතාවය හා බැඳී ඇත.

- ආදිවාසී ප්‍රජාවක් ලෙස පලන්කුඩ් අනන්‍යතාවයට ඔවුන්ගේ අයිතීන් පිළිගනිමින් ආයතනමය පිළිගැනීමක් ලබා දීම. මෙයට අනන්‍යතා සහතික (උප්පැන්න සහතිකය/ජාතික හැඳුනුම්පත්) ද ඇතුළත් කළ යුතුය.

- ප්‍රජාව පිළිබඳ පූර්ව වාර්තා ආයතනමය පිළිගැනීමක් නොමැති කමින් නැති වූ අවස්ථාවක දී, මුල් පලන්කුඩ් ජනාවාස, ඔවුන්ගේ අභ්‍යන්තර සංක්‍රමණ රටා සිතියම්ගත කිරීම, සහ ශ්‍රී ලංකාවේ නැගෙනහිර වෙරළ තීරයේ පලන්කුඩ් ප්‍රජාවගේ සංගණනයක් පැවැත්වීම.

- ඉඩම් අයිතියට සහ භුක්ති විඳීමට අදාළ වගන්ති ඇතුළුව 'ආදිවාසී ජනතාවගේ අයිතිවාසිකම් ප්‍රකාශනය'' (Declaration of Indigenous People's Rights) (2007) දක්වා ඇති පරිදි ඔවුන්ගේ ආරක්ෂාව තහවුරු කරන නීතිමය රාමුවක් දේශීය නීතියට හඳුන්වා දීම.

- පිරිසිදු ජල මූලාශ්‍ර වැනි මූලික සේවාවන් සඳහා සඳහා පහසුකම් ලබා දීම; විධිමත් ප්‍රවාහනය (සාමාන්‍ය බස් මාර්ග ඇතුළුව); විධිමත් සෞඛ්‍ය සේවා පහසුකම් හෝ ගමට පැමිණෙන ජංගම සායන වෙත පහසුකම් ලබා දීම; ගුණාත්මක අධ්‍යාපනයට පහසුකම් සැලසීම හෝ ගමට ඈතින් පිහිටි පාසල් වෙත යාමට සිසුන්ට ප්‍රවාහන පහසුකම් සැලසීම.

- ආදිවාසී ප්‍රජාවට අදාළ වූ විසඳුම් ප්‍රවර්ධනය කිරීම සඳහා ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධන සංසදවලට පලන්කුඩ් ප්‍රජා නියෝජිතයින් ඇතුළත් කිරීම.

- පලන්කුඩ් ප්‍රජාව පිළිබඳ තොරතුරු අධ්‍යාපන පද්ධතියට ඇතුළත් කර, මෙම ප්‍රජාව පිළිබඳ දැනුවත් කිරීම් සහ ඇතුළත් කිරීම (inclusion) ජාතික රූපවාහිනිය සහ අනෙකුත් විකාශන ජාල හරහා සිදු කිරීම.

- මහජන ඉල්ලීම් සහ විශේෂඥ උපදෙස් මත රජය විසින් පනවා තිබූ රසායනික පොහොර තහනම ඉවත් කරත්, ක්‍රමානුකූලව කාබනික ගොවිතැන වෙත මාරු වී වඩාත් තිරසාර ගොවිතැන් ක්‍රමයක් අනුගමනය කිරීමට රජය දිගින් දිගටම කටයුතු කරගෙන යයි. කාබනික ගොවිතැන පිළිබඳ දේශීය සහ ආදිවාසී දැනුම මෙම දිගුකාලීන ඉලක්කය සපුරා ගැනීම සඳහා ඉවහල් විය හැකිය. එහෙයින් ද, ආදිවාසීන්ට (පලන්කුඩ් ජනයාට) ආවේණික වූ තිරසාර ගොවිතැන් ක්‍රම සංරක්ෂණය කිරීම, අධ්‍යයනය කිරීම, සහ භාවිතයට පහසුකම් සැලසීමට පියවර ගත යුතුය.

- සංක්‍රාන්ති යුක්තිය (transitional justice) සහ ප්‍රතිසන්ධානය සඳහා පිහිටුවා ඇති පශ්චාත් යුධ යාන්ත්‍රණයන්ට පලන්කුඩ් ප්‍රජාව ඇතුළත් කර ඔවුන්ට මෙම යාන්ත්‍රණයන් භාවිතයට ඇති අයිතිය පිළිබඳව ක්‍රියාකාරීව ඔවුන්ව දැනුවත් කිරීම.

- යුද්ධයේ මායිමේ සිටි පලන්කුඩ් ප්‍රජාවට සෘජු හා වක්‍ර බලපෑම් ඇති කරන උතුරු හා නැගෙනහිර පළාත් නිර්-මිලිටරිකරණය (demilitarisation) ඇතුළු සංහිඳියාවට අදාළ සියලුම නිර්දේශ සහ ජාතික ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම.

- ජාතික කෞතුකාගාරය, ජාතික ලේඛනාගාර, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව වැනි රටේ ඉතිහාසය සුරැකීමට පැවරී ඇති ආයතනවල පලන්කුඩ් ඉතිහාසය සහ භාෂාව ලේඛනගත කිරීම සහ සංරක්ෂණය කිරීම.

කතුවරුන්:

නටාෂා පලන්සූරිය CEPA හි ජ්‍යෙෂ්ඨ පර්යේෂිකාවකි. ඇය සමාජ සහජීවනය සහ සංහිඳියාව යන තේමා ක්ෂේත්‍රයේ නායකත්වය දරන අතර ඩයස්පෝරා සහ සංවර්ධනය යන තේමා ක්ෂේත්‍රයට යාබද ව ද වෘත්තීයේ නියැලේ. ඊට සමගාමීව, ඇය City, University of London හි ආචාර්ය උපාධිය සම්පූර්ණ කරමින් සිටින අතර, ඇයගේ පර්යේෂණය ශ්‍රී ලංකාවේ සංක්‍රාන්ති යුක්ති (transitional justice) ක්‍රියාවලියේ ශ්‍රී ලාංකික දෙමළ ඩයස්පෝරා සහ අන්තර්ජාතික මැදිහත්වීම කෙරෙහි අවධානය යොමු කරයි. නටාෂා හට City, University of London හි ජාත්‍යන්තර දේශපාලනය සහ මානව හිමිකම් පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් ද ඇති අතර එහිදී ඇයගේ නිබන්ධනය ශ්‍රී ලංකාවේ පශ්චාත් යුද ප්‍රතිසන්ධාන ක්‍රියාවලිය ගවේෂණය කර ඇත. සංක්‍රාන්ති යුක්තිය, පශ්චාත් යුධ ප්‍රතිසන්ධානය, පාලනය සහ ප්‍රජාතන්ත්‍රවාදය, ඩයස්පෝරාවන්හි සම්බන්ධතාවය සහ අන්තර්ජාතික සිවිල් සමාජය යන මාතෘකාවන් ඇයගේ විෂයපථයට අයත් වේ.

තමින්ද්‍රි අලුවිහාරේ CEPA හි ජ්‍යෙෂ්ඨ පර්යේෂිකාවක් වන අතර සමාජ සහජීවනය සහ ප්‍රතිසන්ධානය යන ක්ෂේත්‍ර තේමාව යටතේ වැඩ කරයි. ඇය Monash University වෙතින් ආර්ථික විද්‍යාව, ජනසන්නිවේදනය, සහ ජාත්‍යන්තර සබඳතා විශේෂීකරණය කරමින් ජාත්‍යන්තර අධ්‍යයනය පිළිබඳ උපාධියක් ලබා ඇත. ඇය (ඩිජිටල්) මාධ්‍යයේ පරිණාමය, විදේශ ප්‍රතිපත්ති සම්පාදනය සහ ව්‍යාප්තිය කෙරෙහි එහි ඇති බලපෑම ගවේෂණය කරමින් කොළඹ විශ්ව විද්‍යාලයෙන් දේශපාලන සන්නිවේදනය පිළිබඳ ජාත්‍යන්තර සබඳතා ශාස්ත්‍රපති උපාධියක් ලබා ගත්තාය. ඇයගේ වෘත්තීය පළපුරුද්ද දේශීය හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල, සිවිල් සමාජයන්හි සහ රාජ්‍ය සේවය හා බැඳී ඇත. ඇයගේ විෂයපථය මූලික වශයෙන් අවධානය යොමු කරන්නේ ඩිජිටල් මාධ්‍ය පරිවර්තනය සහ සමාජ ඒකාබද්ධතාවය අතර ඇති සම්බන්ධතාවය යි.

ෂනීන්ද්‍ර අමරසිංහ යනු CEPA හි සමාජ සංහිඳියාව සහ ප්‍රතිසන්ධානය යන තේමාව යටතේ කටයුතු කරන කනිෂ්ඨ පර්යේෂකයෙකි. ඔහුට University of London වෙතින් ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ගෞරව උපාධියක් සහ කොළඹ විශ්ව විද්‍යාලයෙන් ඉංග්‍රීසි (විශේෂවේදී) ගෞරව උපාධියක් ද ලබා ඇත. ආරක්ෂක අධ්‍යයනය (Security Studies), දේශගුණික අර්බුද සහ තිරසාර සංවර්ධනය, රාජ්‍ය ප්‍රතිපත්ති, “ගෝලීය දකුණ” සහ සංවර්ධනය, භාෂා සහ සංස්කෘතික අධ්‍යයනය, සහ ක්වියර් (Queer/ අතික්‍රාන්ති) සහ ස්ත්‍රීවාදී අධ්‍යයනයන් ඔහුගේ විෂයපථයට ඇතුළත් වේ.

**Funded by RoLC University of South Carolina and the U.S. Department of State**

UofSC Rule of Law Collaborative
University of South Carolina